# ලංකා බැංකුව

ලොව ප්‍රමුඛ පෙළේ බැංකු 1000 අතරට ශ්‍රේණිගත කර ඇති, ශ්‍රී ලංකාවේ "අංක 01" රාජ්‍ය වාණිජ බැංකුව වන ලංකා බැංකුව පහත සඳහන් තනතුරු සඳහා අදාළ සුදුසුකම් ඇති, පළපුරුද්ද සහ කැපවීම සහිත උද්යෝගිමත් තරුණ තරුණියන්ගෙන් ලංකා බැංකුවේ නීති අංශය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

## අභ්‍යාසලාභී උසාවි ලිපිකරු / අභ්‍යාසලාභී නොතාරිස් ලිපිකරු

### යෝග්‍යතා නිර්ණායක

ශ්‍රී ලාංකිය පුරවැසියකු විය යුතුය.

### සුදුසුකම් සහ පළපුරුද්ද

- අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් එක් වරකදී ගණිතය, ඉංග්‍රීසි භාෂාව සහ මවුබස (සිංහල / දෙමළ) ඇතුලුව සම්මාන සාමාර්ථ 5 ක් සහිතව සමත් වී තිබීම (අතිරේක විෂයන් හැර)

  සහ
- අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් එක් වරකදී විෂයයන් 3 ක් (සාමාන්‍ය ඉංග්‍රීසි සහ සාමාන්‍ය දැනුම හැර) සමත් වී තිබීම

  සහ
- නීතීඥ සමාගමක හෝ නීතිඥයෙකු යටතේ උසාවි ලිපිකරුවකු / නොතාරිස් ලිපිකරුවකු වශයෙන් වසර 2 ක පළපුරුද්ද.

### වෙනත් සුදුසුකම්

- යතුරු ලිවීමේ වේගය විනාඩියට වචන 30 (ඉංග්‍රීසි) සහ විනාඩියට වචන 25 (සිංහල හෝ දෙමළ)
- පරිගණක සාක්ෂරතාවය සහ ඉංග්‍රීසි භාෂාව මනා ලෙස හැසිරවීමේ හැකියාව අත්‍යවශ්‍යයි.

### වයස

අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනට අවුරුදු 28 හෝ ඊට අඩුවිය යුතුය.

### නියමයන් හා කොන්දේසි

- පුහුණු කාලසීමාව වසර දෙකක් වන අතර එම කාලසීමාව තුළදී මාසික දීමනාවක් (පළමු වසර සඳහා මසකට රු. 25,000/- ක් ද දෙවන වසර සඳහා මසකට රු. 28,000/- ක් ද) ගෙවනු ලැබේ.
- මෙම තනතුර බැංකු සේවයේ සාමාන්‍ය නියමයන් හා කොන්දේසි වලට යටත් වන නමුත් සාමාන්‍ය බැංකු සේවා ප්‍රවාහයෙන් පරිබාහිරවේ. (සංවෘත සේවය)
- පුහුණු කාලය තුළදී බැංකුව විසින් අපේක්ෂා කරනු ලබන අවශ්‍යතා සපුරාලීම මත උසාවි ලිපිකරු - 1 / නොතාරිස් ලිපිකරු - 1 ශ්‍රේණියේ ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කෙරේ.
- කාර්යාල වේලාවෙන් පසුව, සති අන්ත / නිවාඩු දිනවල සේවය කිරීම අපේක්ෂා කෙරේ.

### තෝරා ගැනීමේ පටිපාටිය

- ලිඛිත පරීක්ෂණයකින් සහ යතුරු ලියන වේගය පිළිබඳ පරීක්ෂණයකින් අනතුරුව ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සඳහා පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගනු ලැබේ.

### අයදුම් කිරීමේ පටිපාටිය

අපගේ වෙබ් අඩවිය වන www.boc.lk ("careers" තිරය) හරහා 2021 පෙබරවාරි මස 13 දින හෝ ඊට පෙර ඔබේ ජීවදත්ත එවිය යුතු අතර එම "අයදුම්පතෙහි යොමු අංකය" ඔබේ අනාගත පරිශීලනය සඳහා සුරැකිව තබා ගන්න.

**ඉහත ඉල්ලුම් කිරීමේ පටිපාටියට අමතරව වෙනත් කිසිදු මාර්ගයකින් ලැබෙන අයදුම්පත් කිසිදු හේතුවක් නිසා භාරගනු නොලැබේ.**

**ඉහත සඳහන් අපේක්ෂිත සුදුසුකම් රහිත හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කරන ලද අයදුම්කරුවන් කිසිදු දැනුම්දීමකින් තොරව බඳවා ගැනීමේ පටිපාටියේ ඕනෑම අදියරකදී ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**ප්‍රධාන කළමනාකරු (බඳවා ගැනීම් හා වෘත්තීය සංවර්ධන)**
**මානව සම්පත් අංශය**
**26 වන මහල**
**ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල**
**ලංකා බැංකු චතුරශ්‍රය**
**අංක 1, ලංකා බැංකු මාවත, කොළඹ 01**

**කුමන අයුරකින් හෝ බලපෑම් සිදු කිරීම වහාම නුසුදුසු බවට පත් කිරීමට හේතුවනු ඇත.**
**තෝරාගත් අයදුම්කරුවන් පමණක් කැඳවීමේ අයිතිය බැංකුව සතුවේ.**

ලංකා බැංකුව
BOC
ජාතියේ මහා පහන් ටැඹ